DOI: 10.31357/fhssmst.2011.00053

# ශ්‍රී ලංකාවේ ඝන වාද්‍ය භාණ්ඩවල ප්‍රභවය හා වර්ධනය.

කේ. කේ. පියනන්ද රූපසිංහ

28 NOV 2011

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රපති පරීක්ෂණය සඳහා

සංස්කෘතික අධ්‍යයනය විෂය යටතේ ඉදිරිපත් කරන නිබන්ධයි.

**අපේක්ෂකයාගේ ප්‍රකාශය**

මේ ශාස්ත්‍රීය නිබන්ධය මහාචාර්ය පී. ඩී. රංජිත් ප්‍රනාන්දු මහතාගේ සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මනෝරි මනම්පේරි මහත්මියගේ සුපරීක්ෂණය යටතේ මා විසින් සම්පාදනය කරන ලද බවත්, මේ පර්යේෂණය කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හෝ වෙනත් විශ්වවිද්‍යාලයකට හෝ ආයතනයකට හෝ වෙනත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් සඳහා ද ඉදිරිපත් නොකරන ලද බවත් සහතික කරමි.

....................................

අත්සන.

**උපදේශක/ උපදේශකයන්ගේ නිර්දේශය**

මේ අපේක්ෂකයා විසින් කරන ලද ප්‍රකාශය සත්‍ය බවත්, මේ නිබන්ධය ඇගයීම් කාර්යය සඳහා ඉදිරිපත් කිරීමෙන් පසු නිර්දේශ කරන ලද සදොස් කරුණු නිදොස් කොට ඇති බවත්, ශාස්ත්‍රපති උපාධිය සඳහා විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කිරීමට සුදුසු බවත්, නිර්දේශ කරමි/කරමු.

දිනය 2011 . 11 . 28

අත්සන ..........

මහාචාර්ය පී. ඩී. රංජිත් ප්‍රනාන්දු

දිනය 2011/11/28

අත්සන ..........

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

මනෝරි මනම්පේරි

# අනුක්‍රමණිකාව


| | |
|---|---|
| ග්‍රන්ථනාම පිටුව | i |
| අපේක්ෂකයාගේ ප්‍රකාශය | ii |
| උපදේශක/ උපදේශකයන්ගේ නිර්දේශය | iii |
| අනුක්‍රමණිකාව | iv-v |
| සංකේත සූචිය | vi |
| ඡායාරූප නාමාවලිය | vii |
| උපකාරානුස්මෘතිය | viii-ix |
| සාරාංශය | x-xi |
| හැඳින්වීම | 1 |
| සාහිත්‍යයික විමර්ශන | 4 |
| පර්යේෂණ ක්‍රමවේදය | 11 |

## පළමු වෙනි පරිච්ඡේදය

| | |
|---|---|
| **1. හැඳින්වීම හා සාහිත්‍යය විමර්ශනය** | 13 |
| 1. 1. ශ්‍රී ලංකාවේ ඝන වාද්‍ය භාණ්ඩවල ඓතිහාසික පසුබිම | 15 |
| 1. 1. 1. සාහිත්‍යමය මූලාශ්‍රය | 15 |
| 1. 1. 2. පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය | 27 |
| 1. 1. 2. 1. ශිලා ලේඛන | 27 |
| 1. 1. 2. 2. මූර්ති | 30 |
| 1. 1. 2. 3. කැටයම් | 32 |
| 1. 1. 2. 4. චිත්‍ර | 36 |

## දෙ වෙනි පරිච්ඡේදය

| | |
|---|---|
| **2. ශ්‍රී ලංකාවේ ඝන වාද්‍ය භාණ්ඩ වර්ගීකරණය** | 39 |
| 2. 1 "ඝන වාද්‍ය භාණ්ඩ" යන වාහක නිර්වචනය ගොඩනැගීම | 40 |
| 2. 1. 1 ශබ්ද විද්‍යානුකූල, භාෂානුයුක්ත හා විෂයානුබද්ධ නිර්වචන | 41 |
| 2. 2 ඝන වාද්‍ය භාණ්ඩ හඳුනාගැනීම | 52 |
| 2.3. ඝන වාද්‍ය භාණ්ඩවල ප්‍රභවය උපත් කථා ඇසුරෙන් | 64 |

2. 3. 1 උපත් කථාවල දැක්වෙන ඝන වාද්‍ය භාණ්ඩයන්හි පූර්විකාව 68

2. 3. 2 උපත් කථාවල දැක්වෙන ඝන වාද්‍ය භාණ්ඩයන්හි ප්‍රභවය 71

2. 3. 3 උපත් කථාවල දැක්වෙන ඝන වාද්‍ය භාණ්ඩයන්හි මිනුම්දඬු 75

2. 3. 4 උපත් කථාවල දැක්වෙන ඝන වාද්‍ය භාණ්ඩයන්හි විකාශනය 76

2. 4 ඝන වාද්‍ය භාණ්ඩවල ප්‍රභවය ඓතිහාසික විකාශනය ඇසුරෙන් 79

2. 5 ඝන වාද්‍ය භාණ්ඩවල ප්‍රභවය හා උපත් කථා අතර පරස්පරතා හඳුනා ගැනීම 84

## තෙ වෙනි පරිච්ඡේදය

**3. ශ්‍රී ලංකාවේ ඝන වාද්‍ය භාණ්ඩ නිර්මාණය** 91

3. 1 විවිධ ලෝහ/අලෝහ වර්ග භාවිතය 92

3. 2 ඝන වාද්‍ය භාණ්ඩවල ලෝහ මිශ්‍රණ හා සැකසීම 109

3. 3 වර්තමාන ඝන වාද්‍ය භාණ්ඩ නිර්මාණයේ ස්වරූපය 130

3. 4 ඝන වාද්‍ය භාණ්ඩ නිර්මාණය හා බැඳුණු සමාජ පසුබිම 133

## සිවු වෙනි පරිච්ඡේදය

**4. ශ්‍රී ලංකාවේ ඝන වාද්‍ය භාණ්ඩ භාවිතය** 143

4. 1 ඝන වාද්‍ය භාණ්ඩ භාවිත කරන අවස්ථා 144

4. 2 ශ්‍රී ලංකාවේ ඝන වාද්‍ය භාණ්ඩ භාවිතයේ වර්ධිත ලක්ෂණ 149

4. 3 ශ්‍රී ලංකාවේ ඝන වාද්‍ය භාණ්ඩවල සන්නිවේදන ලක්ෂණ 151

4. 3. 1 ශ්‍රී ලංකාවේ ඝන වාද්‍ය භාණ්ඩ සමාජගත ක්‍රියාවලීන් හා බද්ධ සන්නිවේදනය 152

4. 3. 2 ශ්‍රී ලංකාවේ ඝන වාද්‍ය භාණ්ඩ විෂයගත ක්‍රියාවලීන් හා බද්ධ සන්නිවේදනය 159

4. 4 ඝන වාද්‍ය භාණ්ඩ භාවිතයේ ශබ්ද විද්‍යානුකූල විග්‍රහය 165

4. 4. 1 ධ්වනි චිකිත්සාව සහ ඝන වාද්‍ය භාණ්ඩ භාවිතය 169

4. 4. 2 ශ්‍රී ලාංකේය ඝන වාද්‍ය භාණ්ඩ භාවිතය සමග සිදු කෙරන ශාන්තිකර්මවල
ඇති ශබ්ද තෙරපුම් ප්‍රතිකාර 175

**නිගමන/ සමාලෝචනය** 182

**ආශ්‍රිත ග්‍රන්ථ හා ලේඛන නාමාවලිය** 184

**උපග්‍රන්ථය** 192

**ඡායාරූපාවලිය** 204

**සූචිය** 209

## සංකේත සූචිය

අභි. ප. - අභිධානප්පදීපිකා

උ. තූ. පු. - උඩරට තූර්ය වාදන පුරාණය

උ. නැ. ක. - උඩරට නැටුම් කලාව

කු. සි. ද. අ. - කුවේණි, සිහබා සහ දඹදෙණි අස්න

ජ. ශ. කෝ. - ජනශ්‍රැති ශබ්දකෝෂය

ජ. වි. ශ. කෝ. - ජන විද්‍යා ශබ්දකෝෂය

ධ. ප්‍ර. - ධර්මප්‍රදීපිකාව

පු. ලාං. න. ව. - පුරාතන දෘෂ්‍ය කලා මූලාශ්‍ර මගින් හෙළිවන ලාංකේය නර්තනය හා වාදනය

රු. ජ. පු. - රුහුණේ ජනශ්‍රැති සහ පුරාකතා සාහිත්‍යය

ලං. සං. ස. - ලංකාවේ සංගීත සම්භවය

වං. ම. ටී. - වංසත්ථප්පකාසිනිය, මහාවංස ටීකාව

විම. ති. සං. - විමර්ශන සහිත තිසර සංදේශය

ස. බ. පි. - සබරගමු බලියාග පිළිවෙළ

සද්. ලං. - සද්ධර්මාලංකාරය

සං. සං. - සංගීත සංහිතා

සැල. සං. දී. - සැලළිහිණි සංදේශ දීපනිය

සිං. ථූ. වං. - සිංහල ථූපවංසය

සිං. න. ක. - සිංහල නර්තන කලාව

සිං. බෝ. ව. - සිංහල බෝධිවංසය

සිං. වි. කෝ. - සිංහල විශ්වකෝෂය

සිං. ශ. කෝ. - සිංහල ශබ්දකෝෂය

On. S. - On Sound

P. E. D. - Pali English Dictionary

R. M. T. F. C. - The Role of Music in the Twenty-First Century

Sa. E. D. - A Sanskrit- English Dictionary

Si. E. D. - A Sinhalese-English Dictionary

T. R. W. P. - The Rock and Wall Paintings of Sri Lanka

# ඡායාරූප නාමාවලිය

i.ඇත් පහනේ ඇති තාලම්පට වයන්නා

ii.තාලම්පට වයන්නිය

iii.ඇත් දත් පෙට්ටගම සහ එහි කැටයම

iv.පන්තේරු වයන්නිය (බිතු සිතුවම්)

v.තමාඩෝ ශබ්ද තෙරපුම් උපකරණය

vi.ගැවලය (Court hammer)

vii.මිණි බැඳි අප්‍රිකානු ගෝත්‍රිකයෙක්

viii.යපස් උඳුනේ රූප සටහන

ix.යපස් උඳුන පරීක්ෂාවට ලක් කරන අයුරු

x.ජේතවන පුරාවිද්‍යා කැණීම් භූමියෙන් සොයා ගන්නා ලද විවිධ හැඩවල කෝව

xi.ජේතවන පුරාවිද්‍යා කැණීම් භූමියෙන් සොයාගන්නා ලද වානේ කම්මල

xii.අනුරාධපුරයෙන් සොයා ගෙන ඇති ලෝකඩ බුද්ධ ප්‍රතිමා

xiii.පොළොන්නරුවෙන් සොයා ගන්නා ලද ලොකඩ නටරාජ් ප්‍රතිමාව

xiv.කුරුණෑගලින් සොයා ගන්නා ලද තාරා දෙවඟනගේ ලෝකඩ ප්‍රතිමාව

xv.දල්වන ලද උඳුන (ඌෂ්ණය)

xvi.ලෝහ දියර අච්චුවලට වත් කිරීම

xvii.පස් පෙට්ටිය නමින් හඳුන්වන සාමාන්‍ය අච්චුව

xviii.කැටයම් මෝස්තර සහිත තාලම්පට

xix.ලෝහ ලියවන පට්ටලය

xx.නිකල් පැහැය ගන්වන ලද තාලම්පටක් සහ සීනුවක්

xxi.කඩල කරත්තකරුගේ සීනුව

xxii.දුම්රිය පාලක සීනුව

xxiii.තමාඩෝ ශබ්ද තෙරපුම් උපකරණය සහ අයන් බෝල් (වානේ බඳුන්) උපකරණය

xxiv.මිණි බැඳි ගොනෙකුගේ ඡායා රූපයක්

xxv.සුසරක කරුවලින් ප්‍රතිකාර කිරීම

# උපකාරානුස්මෘතිය

මෙම පර්යේෂණ නිබන්ධය සම්පාදනයේ දී නන් අයුරින් උදව් උපකාර කළ අය බොහෝ වෙති. එහි දී මාගේ පශ්චාද් උපාධිය පූරණය සඳහා පර්යේෂණ නිබන්ධ මාතෘකාව අනුමත කර දී ඒ සඳහා පූර්ණ මග පෙන්වීම ලබා දුන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ සභාපති, මහාචාර්ය ඥාණදාස පෙරේරා ඇතුළු කාර්ය මණ්ඩලයත්, භාෂා හා සංස්කෘතික අධ්‍යයනාංශයේ අංශ ප්‍රධාන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ප්‍රදීප් රත්නායක සහ හිටපු අංශ ප්‍රධාන මහාචාර්ය සමන්චන්ද්‍ර රණසිංහ ඇතුළු අධ්‍යයනාංශ කාර්ය මණ්ඩලයත් ගෞරවයෙන් සිහිපත් කළ යුතු වේ.

මෙම අධ්‍යයනයේ දී මාර්ගෝපදේශකත්වය මැනවින් ලබා දෙමින් මෙවැනි පර්යේෂණාත්මක නිබන්ධයක් සම්පාදනය කිරීමට මා මෙහෙය වූ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ සංගීත පීඨයේ මානව වංශ සංගීත අධ්‍යයනාංශයේ මහාචාර්ය පී. ඩී. රංජිත් ප්‍රනාන්දු සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ භාෂා හා සංස්කෘතික අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාරිණී මනෝරි මනම්පේරි සිහිපත් කරන්නේ ගෞරවයෙනි.

මෙවන් අධ්‍යයනයක අවශ්‍යතාව මැනවින් අවබෝධ කර දී මා දිරිමත් කළ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ උපකුලපති, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජයසේන කෝට්ටගොඩ, නර්තන හා නාට්‍ය කලා පීඨයේ පීඨාධිපති, මහාචාර්ය ආරියරත්න කලුආරච්චි සිහිපත් කිරීම යුතුකමකි. අධ්‍යයන කාලය තුළ මාගේ ඉගැන්වීම් කටයුතුවලින් නිදහස් කර සහය දැක් වූ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ උඩරට නර්තන අධ්‍යයනාංශයේ අංශ ප්‍රධාන ජ්‍යෙෂ්ඨ කථිකාචාරිණී ධම්මිකා ලංකාතිලකටත් ගෞරව පූර්වක ස්තුතිය පුද කරමි. අධ්‍යයන කාර්යයේ දී මතු වූ ගැටලු සහගත තත්ත්වයන්ට දිවා රෑ නොතකා උදව් උපකාර කළ මහාචාර්ය ලයනල් බෙන්තරගේ ද සිහිපත් කරන්නේ හදවතිනි. විවිධ අයුරින් සහයෝගය දැක් වූ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ සියලුම අංශ ප්‍රධාන මහත්ම මහත්මීන්ටත් ආචාර්ය මණ්ඩලයේ සියලු දෙනාටත් පර්යේෂණ කාර්යයෙහිලා අධ්‍යයන නිවාඩු ලබා ගැනීමට මා සමග එක්ව අපමණ වෙහෙසක් දැරූ මා මෙන්ම දුෂ්කර ලෙස පර්යේෂණ කාර්යයෙහි නිරත ආධුනික කථිකාචාර්ය සහෘදයන් ද සිහිපත් කරන්නෙමි. එසේම නර්තන පීඨයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ මහත්ම මහත්මීන්ටත් ස්තුතිවන්ත වෙමි.

තොරතුරු ගවේෂණයේ දී පුස්තකාල පරිහරණයට අවසර ලබා දෙමින් සහයෝගය දැක් වූ ජාතික පුස්තකාලය, කෞතුකාගාර පුස්තකාලය, ජාතික ලේඛනාරක්ෂක පුස්තකාලය, කොළඹ මහජන පුස්තකාලය, සිංහල ශබ්දකෝෂ කාර්යාලය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයීය පුස්තකාලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය පුස්තකාලය, සමාජ විද්‍යාඥයින්ගේ සංගමයේ පුස්තකාලය, හොරණ මහජන පුස්තකාලය යන ආයතනයන්හි පුස්තකාලාධිපතිවරු ඇතුළු කාර්ය මණ්ඩලයටත් ජාතික කෞතුකාගාර සහ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවල නිලධාරි වරුන්ටත් කෘතඥතා පූර්වක ස්තුතිය පුද කරමි.

ක්ෂේත්‍ර අධ්‍යයනයට අදාළව සිදු කළ නිරීක්ෂවලට පාත්‍ර වූ සියලුම ශාන්තිකර්ම ශිල්පීන්ටත් එම ශාන්තිකර්ම ශ්‍රව්‍ය දෘශ්‍ය ලෙස පටිගත කිරීම සඳහා අවසර ලබා දුන් හා සටහන් කිරීම සඳහා දායක වූ සියලු දෙනාටත් ස්තුතිය මෙලෙස පුද කරමි. අධ්‍යයන ක්ෂේත්‍රයේ දී අහඹු ලෙස තෝරා ගත් නියැදිවලට යොමු කරන ලද ප්‍රශ්නාවලි සඳහා ඉවසීමෙන් යුතුව පිළිතුරු දුන් සියලු දෙනාටත් සම්මුඛ සාකච්ඡා ලබා දුන් සියලුම සම්පත් දායකයින්ටත් ස්තුතිය පුද කරන්නේ භක්ත්‍යාදරයෙනි. අධ්‍යයනයට අදාළ රූප සටහන් විචිත්‍රවත්ව තෙලි තුඩට නැංවූ මුදිත තොටගමුව සහෘදයා ද මෙහිලා සිහිපත් කළ යුතු වේ.

පර්යේෂණයට අත්වැලක් වූ පරිගණකයක් හා වීඩියෝ කැමරාවක් මා වෙත ලබා දුන් ඕස්ට්‍රේලියාවේ පදිංචි දන්ත වෛද්‍ය යෝෂාන් වික්‍රමසිංහ සොයුරාටත්, පරිගණක භාවිතය පිළිබඳ කිසිදු දැනුමක් නොලබා සිටි මා හට පරිගණක භාවිතයේ සව් කිරිය වත මා හට කියා දුන් එම්. එම්. රෝහණ වසන්ත සහෝදරයාටත් ස්තුතිය පුද කරන්නේ ගෞරවය පෙරදැරිව ය. මවිසින් යතුරුලියනය කරන ලද මෙම නිබන්ධයෙහි සෝදුපත් කියවා සහයෝගය දැක් වූ කථිකාචාර්ය මහින්ද විමලසිරි, කථිකාචාර්ය සමන් කුමාරතුංග යන සහෝදරයින් ද කෘතවේදීව සිහිපත් කරමි.

මෙම පර්යේෂණ කාර්යයේ දී නන් අයුරින් සහයෝගය දැක් වූ පවුලේ සියලු දෙනාටත්, ලේඛන කටයුතුවල යෙදෙන අවස්ථාවන්හි සැමියෙකුගෙන් හා පියෙකුගෙන් ඉටු නොවන යුතුකම් නිහඬව ඉවසා දරා ගනිමින් මා දිරිමත් කළ මා ප්‍රියඹ ලංකාත්, දෑතේ එල්ලී අනාගතය දකින්නට පියමන් කරන ආදර කෙත්මිණී දියණියත් සෙනෙහසින් සිහිපත් කරමි.

# ශ්‍රී ලංකාවේ ඝන වාද්‍ය භාණ්ඩවල ප්‍රභවය හා වර්ධනය.

කේ. කේ. පියනන්ද රූපසිංහ

## නිබන්ධ සාරාංශය

ශ්‍රී ලංකාවේ ඝන වාද්‍ය භාණ්ඩවල ප්‍රභවය හා වර්ධනය යන මාතෘකාව යටතේ සිදු කරන ලද අධ්‍යයනයේ සාරාංශය මෙසේ ය. පළමු වෙනි පරිච්ඡේදයේ දී ශ්‍රී ලංකාවේ ඝන වාද්‍ය භාණ්ඩවල ඓතිහාසික පසුබිම පිළිබඳව මෙතෙක් සිදු කොට ඇති පර්යේෂණ හා අධ්‍යයන පිළිබඳ විමර්ශනයට ලක් කර ඇත. අධ්‍යයනය විසින් ඝන වාද්‍ය භාණ්ඩ පිළිබඳ සඳහන් සාහිත්‍යය මූලාශ්‍රය හඳුනා ගැනීමත්, එම පර්යේෂණ මගින් පැමිණ ඇති නිගමන පිළිබඳ සාකච්ඡා කරන ලදී. මෙහිලා දේශීය වශයෙන් මෙන්ම විදේශීය වශයෙන් ද ප්‍රකටව පවතින මූලාශ්‍රය සැලකිල්ලට ගෙන ඇති අතර සිංහල භාෂාව පමණක් නොව සංස්කෘත, පාලි සහ ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යයන් ඇසුරු කරන ලද සාහිත්‍යයික මූලාශ්‍රයන් ආවරණය වන පරිදි අධ්‍යයනය ගොඩනැගීමට හැකි විය. පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය පිළිබඳ අධ්‍යයනයේ දී ඓතිහාසික කරුණු අනාවරණය කර ගත හැකි ශිලා ලේඛන, මූර්ති, කැටයම් හා චිත්‍ර පිළිබඳව ගැඹුරින් කරුණු විශ්ලේෂණය කර ඇත.

ශ්‍රී ලංකාවේ ඝන වාද්‍ය භාණ්ඩ පිළිබඳ සිදු කොට ඇති වර්ගීකරණ දෙ වෙනි පරිච්ඡේදයේ දී විමසුමට ලක් කර ඇත. එහි දී ශබ්ද විද්‍යානුකූල, භාෂානුයුක්ත හා විෂයානුබද්ධ නිර්වචන සැලකිල්ලට ගෙන සාර්ව තලයක සිට ක්ෂුද්‍ර දෘෂ්ටිකෝණීය එළඹුමකින් "ඝන වාද්‍ය භාණ්ඩ" යන්නට වාහක නිර්වචනයක් ගොඩනගා ඇත. එම වාහක නිර්වචනය ඇසුරු කර ගනිමින් දැනට පවතින ඝන වාද්‍ය භාණ්ඩ, එයට අන්තර් ග්‍රහණය වන ආකාරය කෙසේ දැයි තර්කානුකූලව ඔප්පු කර ඇත. එමගින් මෙතෙක් ඝන වාද්‍ය භාණ්ඩ වශයෙන් එම කුලකයට අයත්ව නො තිබූ භාණ්ඩ රැසක් ද එම කුලකයට අන්තර් ග්‍රහණය වන බවට හඳුන්වා දී ඇත. ඝන වාද්‍ය භාණ්ඩ සම්බන්ධව පැවති පුරා කථා සහ උපත් කථා සාහිත්‍යය සැලකිල්ලට ගනිමින් එම උපත් කථාවල ව්‍යුහාත්මක ලක්ෂණ වන පූර්විකා, ප්‍රභවය, මිනුම්දඬු හා විකාශනය ආදී ලක්ෂණ පවතින බව හඳුන්වා දීමටත්, එමගින් ඝන වාද්‍ය භාණ්ඩයන්හි ප්‍රභවය හා වර්ධනය පිළිබඳව නව කරුණු අනාවරණය කර ගැනීමටත් හැකි විය. ඝන වාද්‍ය භාණ්ඩවල ප්‍රභවය පිළිබඳව ඓතිහාසික ප්‍රභවය හා විකාශනය සමග උපත් කථා සාහිත්‍යය මගින් හෙළි වන ඝන

වාද්‍ය භාණ්ඩවල ප්‍රභවය හා විකාශනය අතර පවතින සාම්‍යතා මෙන්ම පරස්පරතා ලක්ෂණ පිළිබඳව ද මෙම පරිච්ඡේදයේ දී හඳුනා ගෙන ඇති අතර පරමාර්ථමය වශයෙන් මෙම ප්‍රභවයන් දෙකෙහිම එකඟතාව සමාජ ප්‍රගමනයට දායකවීම බව අනාවරණය කර ඇත.

ශ්‍රී ලංකාවේ ඝන වාද්‍ය භාණ්ඩ නිර්මාණය පිළිබඳව තෙ වෙනි පරිච්ඡේදයේ දී සාකච්ඡා කර ඇත. එකී භාණ්ඩ නිර්මාණය සඳහා භාවිත කරන විවිධ අමුද්‍රව්‍යය පිළිවදව මෙහි දී විශේෂ අවධානය යොමු කර ඇත. ඝන වාද්‍ය භාණ්ඩ නිර්මාණය සඳහා ලෝහ මිශ්‍රණ සැකසීමේ දී සාම්ප්‍රදායික ශිල්පීය ඥානය ප්‍රකට කරමින්, ශිල්පීය රහස් විශ්ලේෂණය කොට ලෝහ මිශ්‍රණවල මූලද්‍රව්‍යාත්මක සංඝටක වියුක්ත කර අනුපාත අගයන් ආසන්න දශම සංඛ්‍යාවට සකසා ගන්නා ආකාරය මෙහි දී විග්‍රහ කොට ඇත. එපමණක් ද නොව ඝන වාද්‍ය භාණ්ඩ නිර්මාණය හා බැඳි ශිල්ප ශ්‍රේණියේ සමාජ පසුබිම පිළිබඳව ද විවරණය කර ඇත.

ශ්‍රී ලංකාවේ ඝන වාද්‍ය භාණ්ඩ භාවිතය පිළිවදව සිවු වෙනි පරිච්ඡේදයේ දී සාකච්ඡා කෙරේ. රංග භාණ්ඩ, වාද්‍ය භාණ්ඩ, රංග ආභරණ, සෙත් කිරීමේ උපකරණ (ශබ්ද චිකිත්සක උපකරණ), සන්නිවේදන උපකරණ වශයෙන් ඒවා භාවිත කරන බව නිදර්ශනාත්මකව පැහැදිලි කොට ඇත. එම භාවිතයේ වර්ධිත ලක්ෂණ වශයෙන් හැඩය, වර්ණය, ප්‍රමාණය, අලංකරණය සහ භාවිතය ප්‍රධාන වන බව පෙන්වා දී ඇත. පරමාර්ථමය වශයෙන් වාද්‍ය භාණ්ඩ, සන්නිවේදන උපකරණ හා ශාරීරික මානසික සුවය සඳහා භාවිත කළ හැකි අතුරු ආබාධ රහිත ශබ්ද චිකිත්සක උපකරණ වශයෙන් ද භාවිතයේ පවතින බව පෙන්වා දී ඇත. දේශීය ශාන්තිකර්මවල මෙම චිකිත්සාත්මක භාවිතයන් වන ශබ්ද තෙරපුම්, වර්ණ තෙරපුම් හා ආලෝක තෙරපුම් ඇතුළත් ප්‍රතිකාර ක්‍රමයක් පවතින බවත්, එකී කාර්යයේ දී ශ්‍රී ලංකාවේ භාවිත ඝන වාද්‍ය භාණ්ඩවලින් ප්‍රධාන කාර්යයක් ඉටු කරන බවත් අනාවරණය කොට ඇත.

මෙම පර්යේෂණ කාර්යයේ දී සමස්ත අධ්‍යයනය සැලකිල්ලට ගනිමින් කරුණු සම්පිණ්ඩනය කර නව නිගමන හා යෝජනා කිහිපයක් ද ඉදිරිපත් කර ඇත.

# හැඳින්වීම

අධ්‍යයන ප්‍රවේශය සලසා ගනිමින් පර්යේෂණ මාතෘකාව පිළිබඳ හැඳින්වීමට තේමා විශ්ලේෂණයක් අවශ්‍ය වේ. මෙහි දී ශ්‍රී ලංකාවේ ඝන වාද්‍ය භාණ්ඩ පිළිබඳ සාහිත්‍යය සමීක්ෂාවක් හා ක්ෂේත්‍ර අධ්‍යයනයක් කිරීම අත්‍යවශ්‍ය කරුණකි.

ප්‍රාග් ඓතිහාසික මිනිසා බාහිර පරිසරය අදෘශ්‍යමාන බලවේගවලින් සැදුම්ලත් එකක් ලෙස සලකන ලදී. ස්වාභාවිකත්වය දේවත්වයට පත් කරමින් අභිචාර පවත්වන ලද බව සමාජ මානව විද්‍යාඥයින් පෙන්වා දී ඇත.[1] අදෘශ්‍යමාන බලවේග හා මිනිසා අතර අන්‍යෝන්‍ය සබඳතාව ඇති කිරීම් වස් භාවිත කරන ලද සන්නිවේදන විධින් අතර ශබ්දය නැතහොත් ධ්වනියට වැදගත් ස්ථානයක් හිමි විය. ප්‍රාථමික මිනිසාගේ සන්නිවේදන මාධ්‍යයේ ප්‍රතිඵලයක් ලෙස ඝන වාද්‍ය භාණ්ඩවල ප්‍රභවය සිදුවූයේ ය, යන්න මූලික උපන්‍යාසයක් වශයෙන් භාවිත වේ.

භාරතීය හින්දු ආගමික වත් පිළිවෙත්හි දී භාවිත විවිධ ඝන වාද්‍ය භාණ්ඩ ශ්‍රී ලංකාවේ ස්ථාපිත වන්නට පාදක වූ තොරතුරු බොහෝ ය. ආක්‍රමණ, සංක්‍රමණ හා සංස්කෘතිකමය වශයෙන් ගොඩනැගුණු මෙවැනි දායාද දේශජ ලක්ෂණවලින් යුක්තව කාලයාගේ ඇවෑමෙන් මෙරට ස්ථාපිත විය. මෙම ක්‍රියාවලියේ දී එයට බෞද්ධ මුහුණුවරක් ද ඇතුළත්ව තිබේ. එමගින් බෞද්ධ අබෞද්ධ ආගමික සංස්කෘතියක් මත ව්‍යාප්ත වූ විවිධ ඝන වාද්‍ය භාණ්ඩ පිළිබඳ මෙතෙක් කිසිදු පර්යේෂණයක් සිදු කොට නොමැති බැවින් එය කාලෝචිත මෙහෙවරක් වන අතර ඒ පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යයනයක් සිදු කිරීම මෙම නිබන්ධයෙන් අපේක්ෂා කෙරේ.

[1] Meet, Margaret, **Primitive Society**, Oxford University Press, London, 1967. - 68p.

ඒ අනුව මෙම ගවේෂණය මගින් ශ්‍රී ලංකාවේ ඝන වාද්‍ය භාණ්ඩ භාවිතය හා ඒවායේ නිර්මාණාත්මක ස්වරූපය හෙළි පෙහෙළි කර, ඝන වාද්‍ය භාණ්ඩ පිළිබඳව මෙතෙක් පැවැති රික්තකය සපුරාලීමට හැකි වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකාවේ ඝන වාද්‍ය භාණ්ඩවල ප්‍රභවය හා වර්ධනයේ දී භාවිතය සහ සාහිත්‍යය අතර පරස්පරතා තිබේ, යන්න මෙම අධ්‍යයනගත උපකල්පනය ලෙස පෙන්වාදිය හැකි ය.

මෙම අධ්‍යයනයේ පළමු වෙනි පරිච්ඡේදයේ දී ඝන වාද්‍ය භාණ්ඩවල ඓතිහාසික පසුබිම සාහිත්‍යය විමර්ශනය මගින් සිදු කරනු ලබන අතර දෙවන පරිච්ඡේදයේ දී මූලික ඝන වාද්‍ය භාණ්ඩ වර්ගීකරණයක් ද සිදු කරයි. මෙම වර්ගීකරණය සඳහා මූලික සංකල්ප තලයේ සිට න්‍යායික තලය දක්වා අදහස් වර්ධනය වීම දැක ගත හැකි ය. අධ්‍යයන මාතෘකාවට අනුව " ඝන වාද්‍ය භාණ්ඩ" යන්න ශබ්ද විද්‍යානුකූල, භාෂානුයුක්ත සහ විෂයානු බද්ධ නිර්වචන ඔස්සේ වාහක නිර්වචනයක් (*Driving Definition*) ගොඩනගා ගැනීමට උත්සාහ දරයි. ඒ අනුව මෙම වාහක නිර්වචනය, විෂයානුගත නිර්වචනයක් දක්වා සීමා ගැන්වීමක් කරනු ලබයි. ඝන වාද්‍ය භාණ්ඩ හඳුනා ගැනීම සඳහා පංචතූර්ය සංකල්පය ඇසුරෙන් එය නැවත විස්තාරණය වන බව හඳුනා ගැනීමට අවශ්‍ය කරුණු සාකච්ඡා කෙරේ. මේ සියල්ල සංගීත විෂයානුගතව සිදු කරන අතර මෙම විග්‍රහය ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට මේ දක්වා සිදු වූ ආකාරය ඓතිහාසික විමර්ශනයක යෙදේ. එහි අනු ක්ෂේත්‍රගතව කරුණු පෙළ ගැස්වීමේ දී සංස්කෘතික දායාද වශයෙන් මිනිසා විසින් ඇති කර ගනු ලැබූ ජන වහර හා භාවිතයේ දී උපයෝගී කර ගනු ලබන ගායනය ශෛලීන් තුළ විදහා දක්වන උපත් කථා ඇසුරින් ඝන වාද්‍ය භාණ්ඩවල

ප්‍රභවය පිළිබඳව සාකච්ඡා කරයි. මෙහි දී සාකච්ඡාවට බඳුන් කෙරෙන ප්‍රධාන කරුණක් වන්නේ ඓතිහාසික ප්‍රභවයන්, එහි විකාශනයන් හා උපත් කථා අතර පවතින පරස්පරතා හඳුනා ගැනිමට ඉදිරිපත් කරන සාධක පිළිබඳව විමර්ශනයක් සිදු කිරීම යි.

තෙ වෙනි පරිච්ඡේදයේ දී ශ්‍රී ලංකාවේ ඝන වාද්‍ය භාණ්ඩ නිර්මාණය සහ ඒ සඳහා භාවිත කරනු ලබන ලෝහ වර්ග හා ලෝහ මිශ්‍රණයන් හඳුනා ගැනීමත් ඒවා සැකසීම සිදු කරනු ලබන ආකාරය පිළිබඳ විමර්ෂණාත්මකව කරුණු ඉදිරිපත් කිරීමත් සිදු කෙරේ. එහි දී වර්තමාන සමාජයේ ඝන වාද්‍ය භාණ්ඩ නිර්මාණයේ ස්වරූපය අධ්‍යයනය කිරීමට සිදු වේ. එමගින් ඝන වාද්‍ය භාණ්ඩ නිර්මාණය හා බැඳුණු සමාජ පසුබිම, සමාජ ආර්ථික ආගමික හා අධ්‍යාපනික වශයෙන් ක්ෂේත්‍රගත වන ආකාරය පිළිබඳ කරුණු සාකච්ඡා කෙරේ.

ශ්‍රී ලංකාවේ ඝන වාද්‍ය භාණ්ඩ භාවිතය පිළිබඳව සිවු වෙනි පරිච්ඡේදයේ දී කරුණු සාකච්ඡා කෙරෙයි. එහි දී ඝන වාද්‍ය භාණ්ඩ භාවිත කරන අවස්ථා විමර්ශනය, ශ්‍රී ලංකාවේ ඝන වාද්‍ය භාණ්ඩ භාවිතයේ වර්ධිත ලක්‍ෂණ, ශ්‍රී ලංකාවේ ඝන වාද්‍ය භාණ්ඩවල සන්නිවේදන ලක්‍ෂණ, ඝන වාද්‍ය භාණ්ඩ භාවිතයේ ශබ්ද විද්‍යානුකූල විග්‍රහය, යන ප්‍රධාන අවස්ථා හතර යටතේ කරුණු විග්‍රහ කෙරේ. අවසාන වශයෙන් මෙම අධ්‍යයනය පිළිබඳව සමාලෝචනයක් ඉදිරිපත් කරමින් පැමිණිය හැකි නිගමනයන් සාරාංශව ඉදිරිපත් කිරීමට අපේක්ෂිත ය.

## සාහිත්‍යයික විමර්ශනය

පුස්තකාල පර්යේෂණ විධික්‍රමය යටතේ සාහිත්‍යයික විමර්ශනයට භාජනය කරන ලද මුද්‍රිත ග්‍රන්ථ, සඟරා, ලිපි ආදී මූලාශ්‍රය පරිශීලනය කරන ලද අතර ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව සතු හා විෂයානුබද්ධ සාම්ප්‍රදායික ශිල්පීන් සතු මුද්‍රණය නොකරණ ලද පුස්කොල පොත්, ලේකම් මිටි, අත් පිටපත්, තුඩපත්, සන්නස් ආදී මූලාශ්‍රය පරිශීලනයට ලක් කෙරිණි. කෞතුකාගාර නිරීක්ෂණ ඇසුරින් තොරතුරු සමීක්ෂණය කරන ලද අතර ශ්‍රව්‍ය දෘශ්‍ය පටිගත කිරීම් සුරක්ෂිත කර තිබූ විශේෂ පුස්තකාල ද පරිශීලනය කරන ලදී. අන්තර්ජාල වෙබ් අඩවි සහ විෂයානුබද්ධ සම්පත් අධ්‍යයනය ද යොදා ගැනිණි. මෙහි දී භාවිත කරන ලද සාහිත්‍යයික විමර්ශනයට ඇතුළත් උක්ත මූලාශ්‍රය ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලියට ඇතුළත් කර ඇත.

ක්ෂේත්‍ර පර්යේෂණ විධික්‍රමය යටතේ සිදු කරන ලද සාහිත්‍යයික විමර්ශනය පර්යේෂණ ක්‍රමවේදයේ දී හඳුන්වා දුන් පරිදි අවස්ථා කිහිපයකින් තොරතුරු ගවේෂණය කරන ලදී.

- විෂයානුබද්ධ සුවිශේෂී භාවිතයන් නිරීක්ෂණයට ලක් කිරීම

1. 2008-05-06 දින සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ කොහුවල පරිශ්‍රයේ පැවති කොහොඹා යක් කංකාරිය ශාන්තිකර්මය නැරඹීම.
2. 2008-05-09 දින සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ පැවති සන්නියකුම/ කලඑළි මඩුව නැරඹීම.
3. 2009-04-29, 30 දිනයන්හි සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ පැවති බලි ශාන්තිකර්මය නැරඹීම.
4. 2009-09-20 දින සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ පැවති මාතර සම්ප්‍රදායයේ සන්නියකුම නැරඹීම.
5. 2009-09-22 දින සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ පැවති මහසොහොන් සමයම නැරඹීම.